**ගම්පොළ නගර සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 20 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගම්පොළ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කර්මාන්ත ණයගැතියෝ රු.560,114 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ප්‍රමාද දෝෂයකින් ගිණුමේ සටහන් වී නොමැති බව දන්වමි. |
| (ii) | වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළිය රු.1,281,978 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පොළිය පිළිබඳ දැන්වීමේ පත්‍රිකාව අනුව පොළිය ගණනය කර තව දුරටත් ලැබිය යුතු පොළිය ගිණුම තුළ ගලපා ඇත. |
| (iii) | ණයහිමියෝ රු.6,867,214 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ගිණුම්ගත විය යුතු නිවැරදි මුදල රු.4,069,076 ක් බව දන්වමි. |
| (iv) | ගබඩා ණයහිමියෝ රු.274,669 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ගබඩා ණයහිමි ලේඛනය අනුව නිවැරදි බව වාර්තා කර ඇත. |
| (v) | ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන වියදම රු.6,257,896 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | කියවීමේ ශාලාව වැඩිදියුණු කිරීමට දැරූ වියදම රු.1,154,909 ක් නොව, රු.849,204 ක් බව දන්වමි. සහ කාර්යාලය ඉදිරිපිට භූමිය අලංකරණයක් බැවින් ප්‍රාග්ධනිත නොකරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (vi) | ආදායම් වියදම් ගිණුමේ ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍ය සේවා සඳහා වියදම රු.500,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ප්‍රවාහන සම්බන්ධතා හා සේවාවල ගණිතමය එකතුව රු.2,407,921 ක් බව වාර්තා කර ඇත. |

(ආ) නොසැසඳුනු ගිණුම්
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.118,321,476 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.7,270,065 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | වෙනස පරීක්ෂා කර නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසරක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.46,394,600 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ආයතන දැනුවත් කර ඇත. |
| (ii) | වසර 1 ක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.14,187,288 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
----------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.46,187,768 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව උපයෝගී ලේඛන, මුදල් ලැබෙන බවට තහවුරු කිරීම් හා ශේෂ සනාථ ලිපි යනාදි සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වාදී ඇති අඩුපාඩු පිළිගන්නා බව දන්වමි. |

**1.4** අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 36(ඉ)(ii) වගන්තිය | | | |
| | (i) | මළල හා ක්‍රිකට් ක්‍රීඩා සමාජය පිහිටි අක්කර 2 ක ඉඩම අනුමැතියකින් හා තක්සේරුවකින් තොරව 2003 වර්ෂයේ සිට වාර්ෂිකව රු.4,000 කට බදුදී තිබුණි. මෙම ඉඩමේ අනවසරයෙන් පෞද්ගලික නිවාස 4 ක් ඉදිකර තිබුණු අතර තවත් පර්චස් 6 ක ප්‍රමාණයක් ඔප්පු අංක 1196 මඟින් රු.2,700,000 කට විකුණා තිබුණි. | විධිමත් අනුමැතියක් හා තක්සේරුවක් මත ගිවිසුම්ගතවී බදු මුදල් අය කළ යුතු වේ. | මෙම දේපළ රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ නගර සභාවට පවරා ගැනීමට සහා අනුමැතිය ලබාගෙන ඇති බව දන්වමි. |
| | (ii) | තක්සේරුවකින් තොරව 2007 වර්ෂයේ සිට වීගුලවත්ත ක්‍රීඩා පිටියට ආසන්න ඉඩම් කොටසක් බදු දී තිබූ අතර, බදු ගිවිසුම අත්සන් කිරීමට හා කාලීනව තක්සේරු කර බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් අනුමැතියක් හා තක්සේරුවක් මත ගිවිසුම්ගත වී බදු මුදල් අය කළ යුතු වේ. | මෙම දේපළ සඳහා මෙතෙක් බදු ගිවිසුමක් ලබාදී නොමැති බව දන්වමි. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා ගිණුම සමඟ ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි, | | | |
| | 571(3) | රු.12,546,665 ක් වටිනා ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. |

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| (i) 2016 මාර්තු 17 දිනැති 2016/03 දරන චක්‍රලේඛයේ 1(V) වගන්තිය | සභාව සතු පොදු වෙළඳපල කඩ කාමර 105 කින් එකවර අයකර ගතයුතු මුදල් රු.68,571,043 ක් අයකරගෙන නොතිබුණි. | එකවර මුදල් චක්‍රලේඛ ප්‍රකාරවම අයකළ යුතුවේ. | විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය ලැබූ පසුව කටයුතු කරන බව දන්වමි. |
| (ii)2010 නොවැම්බර් 24 දිනැති අංක 5/2010 | සුදුසුකම් නොමැති මහජන සම්බන්ධතා නිලධාරියෙකු පත්කර රු.119,255 ක වැටුප් ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව බඳවාගැනීම් සිදුකළ යුතු වේ. | මෙවැනි සුදුසුකම් ඇති නිලධාරීන් වසර 4 ක කාලයකට ස්ථිර නොවන මෙම තනතුරට ඉදිරිපත් නොවන බැවින් ලැබූ අයදුම්පත් අතරින් විශ්වාසවන්ත අයෙකු පත්කර ඇති බව දන්වමි. |

**1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විදේශ අධ්‍යයන චාරිකා අත්හිටුවා තිබියදී හා විදේශ සංචාරයක් සඳහා සභා අරමුදලින් වියදම් දැරීමට අනුමැතිය ලබා දී නොතිබියදී රු.539,000 ක මුදලක් සභා අරමුදලින් වැයකර සභාපතිවරයා විදේශ අධ්‍යයන වැඩසටහනට සහභාගී වී තිබුණි. | සභා අරමුදලින් වියදම් දැරීමට විධිමත් අනුමැතියක් තිබිය යුතු වේ. | 2019 අගෝස්තු 16 දින ආණ්ඩුකාර ලේකම් විසින් නිවාඩු අනුමත කිරීම ඇතුළුව අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සලස්වා දෙන ලෙස දන්වා ඇත. අනෙකුත් අදාළ කාර්යයන් යන්න එම සංචාරය සඳහා දැරිය යුතු වියදම් ලෙස සභාපති විසින් සැලකූ බැවින් සභා අරමුදලින් වියදම් දරා ඇති බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.58,787,580 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.77,971,316 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.563,753 ක් වටිනා අගරු චෙක්පත් නිරවුල් කර නොතිබුණි. | අගරු චෙක්පත් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් පවතී. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 29,800,000 | 31,940,119 | 21,769,387 | 50,185,346 | 29,800,000 | 31,936,586 | 30,616,461 | 45,014,756 |
| (ii) | කුලී | 12,075,000 | 14,116,511 | 14,324,067 | 18,711,237 | 12,000,000 | 13,505,481 | 9,180,131 | 18,745,201 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,500,000 | 2,669,343 | 2,671,343 | 38,000 | 2,600,000 | 2,824,831 | 2,784,831 | 40,000 |
| (iv) | වෙනත් ආදායම් | 33,750,000 | 44,110,635 | 30,675,431 | 22,220,139 | 48,140,000 | 12,570,838 | 29,968,107 | 93,566,930 |
| | | 78,125,000 | 92,836,608 | 69,440,228 | 91,154,722 | 92,540,000 | 60,837,736 | 72,549,530 | 157,366,887 |

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ආයතන 12 කින් වර්ෂ 1 ත් 10 ත් අතර රු.2,840,813 ක වරිපනම් මුදලක් අයවිය යුතුව පැවතුණි. | වරිපනම් වාර්ෂිකව අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | බදුකරුවන් 26 දෙනෙකුගෙන් වාර්ෂික බදු කුලී රු.2,568,117 ක් අයකර ගෙන නොතිබුණු අතර, බදු මුදල් වර්ෂ 5 කට වරක් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂිකව බදුකුලී අයකර වර්ෂ 5 න් 5 තක්සේරුව සංශෝධනය කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ඇ) | සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන නගර සභා බල ප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන වලින් කසළ බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන කසළ බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

**2.3.3 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගම්පොළ දුම්රිය මාර්ගයට ඉහළින් ඉදිකර ඇති වෙළඳ සංකීර්ණයෙන් 2005 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාළව රු.10,458,328 ක කඩ කුලී මුදලක් අයකර නොතිබුණි. | මෙම මුදල් කඩිනමින් කාලීනව අයකර ගත යුතු වේ. | දේපළ සඳහා නඩු පවරා ඇති අතර, එම තීරණ මත මුදල් අයකර ගන්නා බව දන්වමි. |
| (ආ) | ගම්පොළ බස් නැවතුම්පොළ අසළ සාප්පු සංකීර්ණයේ, ගිවිසුම ප්‍රකාරව තක්සේරු වටිනාකමෙන් 1/3 ක් ලෙස නගර සභාවට අය විය යුතු රු.2,411,746 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නීතිඥ සහාය ඇතිව කටයුතු කරගෙන යන බවත් හිඟය අය කිරීමට උපදෙස් දී ඇති බව දන්වමි. |
| (ඇ) | නීතිඥ කාර්යාල සංකීර්ණයෙන් රු.287,113 ක මාසික කුලී හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ කුලී අයකර ගැනීමට නිලධාරීන්ට වගකීම් පවරා ඇති බව දන්වමි. |

**2.3.4 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේදී ව්‍යාපාර ස්ථාන 70 කින් රු.75,000 ක බලපත්‍ර ගාස්තුවක් අයකර නොතිබුණි. | ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු වර්ෂය ආරම්භයේම විධිමත් සමීක්ෂණයක් කර අයකර ගත යුතු වේ. | පිළිගනිමි. |

**2.3.5 වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **තානායම් ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂය තුළ තානායම් ගාස්තු අයකර නොතිබුණු අතර හිඟහිටි තානායම් ගාස්තු ශේෂය රු.708,949 ක් විය. | හිග ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | **පොදු වැසිකිළි ගාස්තු** | | |
| | වසර කීපයක සිට නිරවුල් නොවූ පොදු වැසිකිළි ගාස්තු ශේෂය රු.789,022 ක් විය. | අදාළ ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,989,709 ක් හා මුද්දර ගාස්තු රු.12,500,000 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 7 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහල් 3 කින් යුත්තව ඉදිකිරීමට සැලසුම් කළ පොදු වෙළඳපලේ මහල් 2 ක් රු.2,002,742,936 ක් වැයකර ඉදිකර තිබුණි. වසර 13 ක් ගතවී ඇතත්, ඉහළ මහල ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු අතර, කොන්ක්‍රීට් කොටස් පුපුරායාම නිසා එම ස්ථානවලින් වැසි ජලය කාන්දු වීම් සිදුව තිබුණි. | අපේක්ෂිත නිමැවුම් මට්ටම ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉහල මහලට වහලයක් ඉදිකිරීමට සැලසුම් කර ඇති බව දන්වමි. |

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කසළ කළමනාකරණය කිරීම සඳහා දිගුකාලීන විධිමත් වැඩපිළිවෙළක් සකසා නොතිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙළක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පොදු වෙළඳපලෙහි මාළු වෙළඳාම සඳහා ලබාදුන් කඩ කාමර 5 ක එකවර ගෙවීමේ මුදල් රු.540,011 ක් අයකර නොතිබුණි. | එකවර ගෙවීමේ මුදල් චක්‍රලේඛ ප්‍රකාරව අයකර ගත යුතු වේ. | ලැබිය යුතු හිඟ මුදල රු.540,011 ක් පමණ බව දන්වමි. |
| (ආ) | වසර 05 කට වරක් කඩ කුලී තක්සේරු කල යුතු වුවත් සභාව සතු වෙළඳ සංකීර්ණවල කඩ කුලී 2008 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. | කඩ කුලී තක්සේරුව කාලීනව සිදුකළ යුතු වේ. | තක්සේරු කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සභාව සතු ඉඩම් කොටස් 114 ක් බදු දීමට අදාළව ලිපිගොනු නොතිබුණු අතර, එම ඉඩම් තක්සේරුකර නොදියුණු වටිනාකම හා බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා ඉඩම් තක්සේරු කර ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමීක්ෂණයක් කර ඇති අතර ගිවිසුම්ගත වී හිඟ මුදල් අයකර වාර්තා කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2015,2017 හා 2018 වර්ෂවලදී සිදුකර තිබූ තක්සේරුව මත සභාව සතු ඉඩම් කොටස් 9 ක් සඳහා ලැබිය යුතු මූලික මුදල රු.9,512,000 ක් අයකර නොතිබුණි. | ඉඩම් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් පිළිබඳව ලේඛනයක් සකස් කර ආදායම් පරීක්ෂක මහතුන්ට ලබා දී මුදල් අයකර විගණනයට වාර්තා කරන බව දන්වමි. |
| (ඉ) | ලේඛනගත වූ බදු ඉඩම් කොටස් 82 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණු අතර, සභා තීරණ මත ඉතා අඩු මාසික බදු කුලියක් අයකර තිබුණි. | ඉඩම් බදු දීමේ ක්‍රමවේදය අනුගමනය කර බදු දීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් පිළිබඳව ලේඛනයක් සකස් කර ආදායම් පරීක්ෂක මහතුන්ට ලබා දී මුදල් අයකර විගණනයට වාර්තා කරන බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක අතිරික්තතා 3 ක් හා සේවක පුරප්පාඩු 50 ක් විය. | අතිරික්තතා ඇති නොවන ලෙස හා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ට දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ආ) | නිලධාරීන් 15 දෙනෙකුගෙන් රු.963,294 ක සේවක ණය ශේෂය අයකර නොතිබුණි. | සේවක ණය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු පොදු වැසිකිළි ටෙන්ඩර් කර බදු දීමට කටයුතු නොකර සභාවේ සේවය කරන කම්කරුවෙකු වෙත බදුදී තිබුණි. | ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කළ යුතුවේ. | ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු සියළු වැසිකිළි විධිමත්ව ටෙන්ඩර් කරන බව දන්වමි. |
| (ආ) | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී සැලසුම් කමිටුවේ නිර්දේශ නොසලකා සැලසුම් අනුමත කර තිබුණි. | සැලසුම් කමිටුවේ නිර්දේශ මත සැලසුම් අනුමත කළ යුතු වේ. | මොවුන් කලක සිට වරිපනම් ගෙවන නිසාත් වෙනත් පාර්ශවවලට හානි නොවන ලෙස ගොඩනැගිලි ඉදිකිරීමට කාර්යාල සටහන් මඟින් අවසර ලබාදී තිබූ බව දන්වමි. |
| (ඇ) | 2008 වරිපනම් තක්සේරුව මත 2019 වර්ෂයේදී ද වරිපනම් බදු අයකර තිබුණි. | වර්ෂ 5 කට වරක් වරිපනම් බදු තක්සේරු කළ යුතු වේ. | තක්සේරු කරන ලෙස දන්වා යවා ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නීතිඥ කාර්යාල 15 ක වසර 10 ගිවිසුම් කාලය, අවසන් වී තිබුණද විධිමත්ව තක්සේරු හා ටෙන්ඩර් කර බදු දී නොතිබුණි. | විධිමත්ව තක්සේරු කර ටෙන්ඩර් කිරීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරුවක් ලබා ගැනීමට දන්වා යවා ඇත. ඉදිකිරීම් නීතිඥ මහතුන්ගේ වියදමින් කළ බව වාර්තා කර ඇත. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ඉඩම් මැන ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුවේ. | වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.5.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොදු වෙළඳපල අංක 126 දරන කඩ කාමරය රු.1,000,000 ක එක්වන් මුදල් මත තක්සේරු කර තිබූ නමුත් 2019 ඔක්තෝබර් 02 වන දින වන විටත් බදු දී නොතිබුණි. එම කඩ කාමරය ආසන්නයේ ඇති කඩ කාමරවල වෙළඳුන් විසින් ගබඩාවක් ලෙස භාවිතා කර තිබුණි. | සභාව සතු කඩ කාමර බදු දී ආදායම් උපයා ගත යුතුවේ. | අනවසරයෙන් බඩු දමා ඇති අය ඉවත්කර මුද්‍රා තැබීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | පොදු වෙළඳපලේ කඩ කාමර 36 ක් බදු දීමෙන් තොරව හා කඩ කාමර 102 ක් ව්‍යාපාරික කටයුතු කිරීමෙන් තොරව වසා දමා තිබුණි. | කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

### 3.5.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,601,220 ක වටිනාකම වූ වත්කම් වර්ග 7 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | නිෂ්ක්‍රීය වත්කම් වෙන්දේසි කිරීම කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 වර්ෂයේ සිට රු.903,453 කට මිලදී ගත් ටයර් 49 ක් ප්‍රයෝජනයකට නොගෙන ගබඩා කර තිබුණි. | අනවශ්‍ය තොග රැස්කර තබා නොගැනීමට කටයුතු කළ යුතු වේ. | කසළ ප්‍රවාහනයට කම්පැක්ටර් රථ ලැබීම සමඟ පෙර පැවති ට්‍රැක්ටර් යොදා ගැනීම අඩුවීම නිසා ටයර් ගබඩාවේ ඉතුරුවී ඇති බව දන්වමි. |

**3.5.4 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී වෙන්දේසි කිරීමට නියමවූ ට්‍රැක්ටරය, ලොරි රථය හා ගලි රථය වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම. | ඉදිරි කටයුතු කරන බව දන්වමි. |

**3.6 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 සැප්තැම්බර් 21 දින පවත්වා තිබූ නගර සභා සභාපතිවරුන්ගේ සම්මේලනය සඳහා නගර සභාවේ ලිපි ශීර්ෂ භාවිතා කර සභාවේ කාර්යමණ්ඩලය හා සම්පත් යොදාගෙන රු.450,000 ක මුදලක් එකතු කර තිබුණි. | මෙවැනි මුදල් එකතු කිරීම නගර සභා ආඥා පනතේ 158 වගන්තියට පටහැනි වේ. | උත්සවය සාර්ථක කර ගැනීමට අනුග්‍රාහකත්වය ඉල්ලන ලදී. මෙය අවිධිමත් මුදල් රැස් කිරීමක් නොවන බව දන්වමි. |